## ලිංගාශ්‍රිත රෝග සායන පවත්වන රජයේ රෝහල් හා ඒවායේ දුරකථන අංක

**මධ්‍යම සායනය**
**නො 29, ද සේරම් පෙදෙස,**
**කොළඹ 10.**
**දු. ක. 011-2667163**

| | | |
|---|---|---|
| යාපනය | - | 021-2222245 |
| වවුනියාව | - | 024-2224575 |
| මන්නාරම | - | 023-2232261 |
| ත්‍රිකුණාමලය | - | 026-2222261 |
| කල්මුණේ | - | 067-2229496 |
| අනුරාධපුරය | - | 025-2222261 |
| පොළොන්නරුව | - | 027-2222384 |
| මඩකලපුව | - | 065-2222641 |
| කුරුණෑගල | - | 37-2224339 |
| ගම්පහ | - | 033-2222261 |
| හලාවත | - | 032-2220750 |
| මාතලේ | - | 066-2222261 |
| මහනුවර | - | 081-2203622 |
| කෑගල්ල | - | 035-2222261 |
| මීගමුව | - | 031-2224156 |
| රාගම | - | 011-2960224 |
| අම්පාර | - | 063-2222261 |
| නුවරඑළිය | - | 052-2234393 |
| කොළඹ | - | 011-2667163 |
| බදුල්ල | - | 055-2276261 |
| කළුතර | - | 034-2236937 |
| රත්නපුර | - | 045-2225396 |
| මොණරාගල | - | 055-2276261 |
| ගාල්ල | - | 091-2245998 |
| හම්බන්තොට | - | 047-2220247 |
| මාතර | - | 041-2232302 |
| ඇඹිලිපිටිය | - | 047-2230261 |
| බලපිටිය | - | 091-2255447 |

**අපි** දැනුවත් වෙමු
**අන් අයත්** දැනුවත් කරමු
**HIV** වලින් ආරක්ෂා වෙමු . . .

**සෑම මිනිසෙකුටම**
සෙනෙහසින් - ගෞරවයෙන් සලකමු
**HIV** සමඟ ජීවත්වන්නන්ට ද
සෙනෙහස - ගෞරවය පිරිනමමු
අපි **'සැබෑ මිනිසුන්'** වෙමු . . .

HAPPY LIFE

ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට

අමතන්න **2 588 488**

පිවිසෙන්න **www.happylife.lk**

SMS කරන්න **071 6 408 408**



# HIV/AIDS
# පිළිබඳව **දැනුවත් වෙමු** එයින් **සුරැකෙමු**

SRI LANKA
enriching relationships

NATIONAL STD/AIDS CONTROL PROGRAMME

ILO

# HIV

| | | |
|---|---|---|
| H | Human | මානව |
| I | Immunodeficincy | ප්‍රතිශක්ති ඌනතා |
| V | Virus | වෛරසය |

# AIDS

| | | |
|---|---|---|
| A | Acquired | නතුකරගත් |
| I | Immune | ප්‍රතිශක්ති |
| D | Deficiency | ඌනතා |
| S | Syndrome | සහලක්ෂණය |

## HIV/ AIDS පිළිබඳ යථාර්ථය

- HIV වයිරසය ශරීරයට ඇතුළු වුවහොත් HIV ආසාදිතයෙකු බවට පත්වේ.
- රෝග ලත්ෂණ ඇති විමට වෛරසය ඇතුළු වී වසර 8-10 දක්වා කාලයක් වුවත් ගත විමට ඉඩ ඇත.
- HIV ආසාදිතයෙකු රෝග ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථාව AIDS ලෙස හැඳින්වේ.
- AIDS රෝගින්ගෙන් වාගේම HIV ආසාදිතයෙකුගෙනුත් නිරෝගි පුද්ගලයෙකුට හට රෝගය බෝවන ආකාරවලින් රෝගය බෝවීමට ඉඩ ඇත.
- HIV වෛරසය අපගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය අඩපණ කරයි. ඒ හේතුවෙන් විවිධ රෝග කාරකවලට ගොදුරු වීමේ අවදානම ඇති වේ.

## HIV ආසාදනය වන ප්‍රධාන ආකාර....

- HIV ආසාදිතයෙකු සමග පවත්වන අනාරක්ෂිත ලිංගික සබඳතා මගින් (යෝනි, ගුද, මුඛ)
- HIV ආසාදිත රුධිරය හෝ රුධිර නිෂ්පාදන ශරීරයට ඇතුලු වීමෙන්
- HIV ආසාදිත මවකගෙන් උපදින දරුවාට යෑමේ ප්‍රවණතාවක් ඇත.

  HIV ආසාදනයෙන් පෙළෙන කාන්තාවක් ගැබ්ගත් විට උපදින දරුවාටත් අසාදනය ඇති වීමට 15%-45% පමණ ප්‍රවණතාවක් ඇත. ඒත් මෙම තත්ත්වය අඩු කිරීමට ඖෂධ ඇත.

# HIV/AIDS බෝ වීම වැලැක්විමේ ක්‍රම

## 1 අනාරක්ෂිත ලිංගික සම්බන්ධතා මගින් බෝවීම වැළැක්වීම සඳහා වගකිව යුතු ලිංගික චර්යා



- ලිංගික සබඳතා කල් දැමීම
  - ▶ විවාහය තෙක් ලිංගික සබඳතා පමා කිරීම.
  - ▶ අවදානම් අවස්ථාවලදී සහකරු / සහකාරියගෙන් තාවකාලිකව වෙන්වී සිටීම
- අන්‍යොන්‍ය විශ්වාසයෙන් යුත් එක් සහකරුවෙකුට / සහකාරියකට පමණක් ලිංගික සබඳතා සීමා කිරීම.
- තම විශ්වාසවන්ත සහකරුට/ සහකාරියට පරිබාහිර අය සමග ලිංගික සබඳතා පවත්වන අවස්ථාවකදී සෑමවිටම නිවැරදි ලෙස කොන්ඩමයක් පැළඳීම.
- තුරුළු කරගැනීම, සාමාන්‍ය සිප ගැනීම කලවා අතර සංසර්ගය හා ස්වයංවින්දනය ද ආරක්ෂිත ලිංගික ක්‍රම වේ.

## 2 රුධිරය මගින් HIV/AIDS බෝවීම වැළැක්විම



- ඉදිකටු, සිරිංජර හෝ අනෙකුත් සම සිදුරුකරන උපකරණ භාවිතයේදී ඒවායේ ජීවානුහරණය ගැන සැළකිලිමත් විය යුතුය.
- රුධිර පාරවිලයනය කළ යුතු අවස්ථා අඩු කළ යුතුය.
- අනාරක්ෂිත ලිංගික චර්යාවන්හි යෙදී ඇත්නම් රුධිරය දන්දීමෙන් වළකින්න
- ඔබ රුධිර පාරවිලයනය කරයි නම් HIV ප්‍රතිදේහ සඳහා පරික්ෂා කර ඇත්දැයි දැනගැනීමට ඔබට අයිතියක් ඇත.

## 3 ආසාදිත මවකගෙන් උපදින දරුවාට HIV ව්‍යාප්තවීම වළක්වා ගැනීම.



- ලිංගික සක්‍රීය වයසේ සිටින කාන්තාවන් HIV ආසාදනයෙන් වැළකී සිටීම.
- ගර්භණීභාවයට පත්වීමට පෙර HIV පරීක්ෂාවට ලක්වීම හා එහි ප්‍රතිඵල අනුව ආසාදිත කාන්තාවක් නම් සැලසුම් සහගත ගැබ්ගැනීමක් සඳහා අවශ්‍ය නිසි වෛද්‍ය උපදෙස් ලබා ගැනීම.
- ගැබ්ගෙන සිටියදී HIV ආසාදිත බව දැනගත් විට නොපමාව වෛද්‍ය උපදෙස් ලබා ගැනීම.
- ගැබිණි කාලයේදී ඖෂධ ලබාදීමෙන් හා වෛද්‍ය උපදෙස් ලබා ගැනීමෙන් දරුවාට රෝගය වැළදීමේ අවදානම අඩුකර ගත හැක.

# ලිංගාශ්‍රිත රෝග

- ගොනෝරියා, සුදු බිංදුම, උපදංශය, හර්පීස් වැනි ලිංගිකව බෝවන රෝග වලින් වැළකීමට ද අනාරක්ෂිත ලිංගික සබඳතා වලින් වැළකිය යුතුය.
- පුද්ගලයෙකුට රෝග ලක්ෂණ නොමැතිව ද ලිංගාශ්‍රිත රෝග තිබිය හැකි වේ.

**දැනටමත් අනාරක්ෂිත ලිංගික සබඳතා පවත්වා ඇත්නම්, ළඟම ඇති ලිංගාශ්‍රිත රෝග සායනයකට පැමිණ උපදෙස් ලබා ගන්න.**

- HIV සදහා නොමිලේ සිදු කරන රුධිර පරීක්ෂාව සිදු කර ගත හැක. එමෙන්ම අනෙකුත් ලිංගාශ්‍රිත රෝග සඳහා ද ප්‍රතිකාර ලබාගත හැක.

**HIV ආසාදනය මුල් කාලය තුළම හඳුනා ගැනිම මඟින් ප්‍රතිකාරවලට යොමු වී දිගුකලක් නිරෝගීව ජීවත් විය හැක.**